තාක්ෂණ අමාත්‍යාංශය தொழில்நுட்ப அமைச்சு MINISTRY OF TECHNOLOGY

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
ஆட்களைப் பதிவு செய்யும் திணைக்களம்
DEPARTMENT FOR REGISTRATION OF PERSONS

10 වන මහල, සුහුරුපාය, ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල.
10th Floor, Suhurupaya, Sri Subhuthipura rd, Battaramulla.

මගේ අංකය / எனது இல. / My Ref. : පු.ලි.දෙ./ මෙ/ මාධ්‍ය ඒකකය/ මාධ්‍ය නිවේදන හා දැන්වීම්

ඔබේ අංකය / உமது இல. / Your Ref. :

දිනය / திகதி / Date : 2021.09.29

"විශ්වසනීය පුද්ගල අනන්‍යතාව හැඳුනුම්පතයි" "அடையாள அட்டை - நம்பகத்தன்மையான தனிநபர் அடையாளம்" "Identity Card, the Trusted Personal Identity"

**මහජනතාව වෙත කරනු ලබන නිවේදනයයි.**

**<u>පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ මහජන සේවාවන් නැවත විවෘත කිරීම.</u>**

කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් රජය පනවා තිබූ නිරෝධායන ඇඳිරි නීතිය, 2021.10.01 දින සිට ඉවත් කිරීමට තීරණය කර ඇති බැවින් පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය සහ සියලුම පළාත් කාර්යාලවල මහජන සේවාවන් සෞඛ්‍ය අධ්‍යක්ෂක ජනරාල් විසින් පනවා ඇති මාර්ගෝපදේශවලට අනුකූලව 2021.10.04 වන සඳුදා දින සිට ආරම්භ කිරීමට තීරණය කර ඇත.

එසේ වුව ද ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමේ එක් දින සේවාව තව දුරටත් ක්‍රියාත්මක නොවන බව කාරුණිකව දන්වන අතර, ජාතික හැඳුනුම්පත් ලබා ගැනීම සඳහා වන ඉල්ලුම්පත්, ග්‍රාම නිලධාරී මගින් සහතික කළ පසු අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පිහිටුවා ඇති පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලය වෙත භාර දිය යුතු බව කාරුණිකව දන්වමි. එම අයදුම්පත් සඳහා ජාතික හැඳුනුම්පත් සකස් කර, අයදුම්කරුවන්ගේ පෞද්ගලික ලිපිනයට ලියාපදිංචි තැපැල මගින් කඩිනමින් යොමු කිරීමට කටයුතු කරනු ලැබේ.

ඉහත පරිදි භාර දෙනු ලබන අයදුම්පත් සඳහා හෝ කලින් භාර දෙන ලද අයදුම්පත් සඳහා ඉතා හදිසි අවශ්‍යතාවයන් මත, ජාතික හැඳුනුම්පත් ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම්, එම අයදුම්කරුවන් පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයට හෝ ගාල්ල පළාත් කාර්යාලයට පැමිණීම සඳහා සතියේ වැඩ කරනු ලබන දිනයන් හි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පිහිටුවා ඇති, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ ප්‍රාදේශීය කාර්යාලය මගින් හෝ පහත සඳහන් දුරකථන අංක මගින් දිනයක් හා වේලාවක් වෙන් කරවා ගැනීම අනිවාර්ය බව කාරුණිකව දන්වමි.

- බත්තරමුල්ල ප්‍රධාන කාර්යාලය : 0115226126 - 0115226100
- දකුණු පළාත් කාර්යාලය : 0912228348
- වයඹ පළාත් කාර්යාලය : 0372224337
- උතුරු පළාත් කාර්යාලය : 0242227201
- නැගෙනහිර පළාත් කාර්යාලය : 0652229449

**ව්‍යානි ගුණතිලක**
පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්